JMC vLearning
"your virtual learning partner"

# LKAS 08 : ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි - පුනරීක්ෂණ

## AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය


සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# LKAS 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි



JMC vLearning "your virtual learning partner"

## 2018 ජූලි ප්‍රශ්න අංක 07 (a)

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත SRL සමාගමේ** පහත සඳහන් තොරතුරු ලබාදී ඇත. සමාගම 2017 අප්‍රේල් 01 දින පිරියත සහ යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන ලදි. එම සමාලෝචනයට අනුව පිරියත සහ යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 3 සිට 8 දක්වා 2017 අප්‍රේල් 01 දින සිට වෙනස් කිරීමට තීරණය කරන ලදි. 2017 අප්‍රේල් 01 දිනට පිරියත සහ යන්ත්‍රවල පිරිවැය සහ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු. 8,000,000/- ක් හා රු. 3,000,000/- ක් විය.



## 2018 ජූලි ප්‍රශ්න අංක 07 (a)

**ඔබ විසින් කළ යුතු දෑ:**

ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි පිළිබඳ වූ (LKAS 8) ප්‍රමිතිය අනුව ඉහත සඳහන් අවස්ථාව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණයේදි සලකා බලනු ලබන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)



JMC vLearning "your virtual learning partner"

## 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (a)

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල සිදුවූ පහත සඳහන් සිදුවීම් **සීමාසහිත ගිත්මි සමාගමේ** මූල්‍ය කළමනාකරු සොයාගෙන තිබේ.

(a) 2018 අප්‍රේල් 01 දින සිට **සීමාසහිත ගිත්මි සමාගම** විසින් නව SAP B1 නම් නව ගිණුම්කරණ මෘදුකාංගයක් හඳුන්වා දුන් අතර, එදින සිට සමාගමේ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කර තිබේ. 2018 මාර්තු 31 දින දක්වා තොග වටිනාකම් ගණනය කරනු ලැබුයේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය යටතේ වන අතර, නව ගිණුම්කරණ පද්ධතිය අනුව තොග අගය කිරීම බර තැබූ සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට ගණනය කළ යුතු විය.



JMC vLearning
"your virtual learning partner"

## 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (a)

තොග ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් 2018 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති තොග වටිනාකමට වඩා තොග රු. මිලියන 6.7 කින් අධිගණනය වී තිබුණි.

(b) 2017 දෙසැම්බර් 31 දින අත්පත් කරගනු ලැබූ රු. 500,000/- ක් වටිනා කාර්යාල උපකරණවලට අදාලව පසුගිය මූල්‍ය වර්ෂයේ (2017/18) ක්ෂය වීම් ගිණුම් තැබීමට **සීමාසහිත ගිත්මි සමාගමේ** සහකාර ගණකාධිවරයා අසමත් වී තිබේ. සමාගම විසින් කාර්යාල උපකරණ, සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැයට ක්ෂය කරන අතර, කාර්යාල උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 කි.

# 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (a)

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 (LKAS 8) ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතය අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගිත්මි සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලට ඉහත සඳහන් සිදුවීම් දෙකෙහි බලපෑම **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

Sandeepa Jayasekera - JMC 17

17

JMC vLearning
"your virtual learning partner"